# නව ව්‍යවස්ථාවේ මැතිවරණ ක්‍රමය පිළිබඳ වාර්තාවක් පැෆරල් සකසයි



■ ඉන්දික හේවාවිතාරණ

යෝජිත නව ව්‍යවස්ථාව තුළ මැතිවරණ ක්‍රමය සකස් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ විද්වතුන්ගේ වාර්තාවක් සහ ආගමික නායකයන්, සිවිල් සංවිධාන හා පුරවැසියන්ගේ අදහස් මත වාර්තාවක් සකසා නව ව්‍යවස්ථාවක් සකස් කිරීමට ජනතා අදහස් ලබාගන්නා කමිටු ලේකම් කාර්යාලයට බාරදෙන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා ජනතා අදහස් ලබාදෙන ලෙසට මේ වනවිට රට පුරා දැනුවත් කිරීමක් ආරම්භ කර තිබෙන බවත්, එහිදී පැෆරල් සංවිධානය ලෙසද ජනතා අදහස් ලබාගන්නා බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මීට අමතරව පවතින මැතිවරණ ක්‍රමයේ හොඳ සහ නරක පිළිබඳව මහාචාර්යවරුන්, ආචාර්යවරුන් ඇතුළු විද්වතුන්ගෙන් අදහස් ලබාගනිමින් සිටින බවත්, සකස් කරන ව්‍යවස්ථාව විධායක ජනාධිපති ක්‍රමය සහිත පාලනයක් නම් එහිදී ඇති කළ යුතු මැතිවරණ ක්‍රමය පිළිබඳව හා පාර්ලිමේන්තුව සහිත පළාත් ක්‍රමයක් නම් එහිදී ඇති කළ යුතු මැතිවරණ ක්‍රමය පිළිබඳවත් අදහස් ලබා ගනිමින් සිටින බවද ඔහු පවසා සිටියේය.

මෙලෙස සකස් කරන වාර්තාව සහ ජනතාවගේ අදහස් මත ලබාගන්නා වාර්තාව මාර්තු මාසයේදී ජනතා අදහස් ලබාගන්නා කමිටු ලෙකම් කාර්යාලයට බාරදෙන බවද හෙතෙම සඳහන් කළේය.